# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

**අංක 11,633 — 1959 ජනවාරි 2 වැනි සිකුරාද — 2.1.1959**

**(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරනු ලදී)**


# IV වැනි කොටස—පළාත් පාලනය

**(එක් එක් කොටස වෙන වෙනම බැඳ තබා ගත හැකි වීම පිණිස පිටු අංක යොදා ඇත්තේ වෙන වෙනම එක් එක් කොටසට ගැලපෙන පරිද්දෙනි)**


| | පිට |
|---|---|
| පළාත් පාලන නිවේදන ... ... | 1 |
| තනතුරු-ඇබෑර්තු ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... | 1 |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපණත යටතේ දැන්වීම් ... ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශ ... | — |
| අය වැය ලේඛන ... ... | — |
| දේපළ විකිණීම ... ... | — |
| මාගී කොම්පි දැන්වීම ... ... | — |
| විවිධ දැන්වීම් ... ... | 4 |


## පළාත් පාලන නිවේදන

ජී. බී. 14/16/7.

### 1952 අංක 6 දරන ප්‍රදේශාධිකාරි සභා (පොදු ආදශී අතුරු ව්‍යවස්ථා) ආඥාපනත

1952කේ අංක 6 දරන ප්‍රදේශාධිකාරි සභා (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) ආඥාපනතේ 3 වෙනි වගන්තිය යටතේ ගාළු දිස්ත්‍රික්කයේ කතළුව ගම් ප්‍රදේශයේ ගම්කායශී සභාව විසින් සම්මත කර ගන්නා ලද පහත දැක්වෙන යෝජනාව එකී වගන්තියේ ප්‍රකාර මෙහි පළකරනු ලැබේ.

**යෝජනාව**

ප්‍රදේශ පාලන අමාත්‍යවරයා විසින් සම්පාදනය කරන ලද්දාවූද සෙනේට් මන්ත්‍රී මණ්ඩලයේ හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් අනුමත කරන ලද බව 1953 අගෝස්තු මස 7 වෙනි දින අංක 10,560 දරන ගැසට් පත්‍රයේ පළවූ නිවේදනයෙන් ප්‍රකාශ කරන ලද්දාවූද, පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල 1, 3, 4, 5, 7, 8, 9, 10, 11, 12, 13, 15, 16, 18, 19, 20, 21, 22, 23 24 25 26 27 30 31, 32, 33, 34, 35, 36 සහ 37 දක්වාවූ කාණ්ඩ මේ යෝජනාව ගැසට් පත්‍රයේ පළවන දින සිට සම්මත කර ගැනීමට කතළුව ගම් ප්‍රදේශයේ ගම්කායශී සභාව විසින් 1952කේ අංක 6 දරන ප්‍රදේශාධිකාරි සභා (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) ආඥාපනතේ 3 වෙනි වගන්තියේ (1) වෙනි උප වගන්තිය යටතේ මෙයින් යෝජනා කරනු ලැබේ.

එල්. එච්. ඒ. ද සිල්වා,
කතළුව ගම්කායශී සභාවේ ප්‍රධාන තැන.

වර්ෂ 1958ක්වූ දෙසැම්බර් මස 1 වෙනි දින,
කතළුව ගම්කායශී සභා කාර්යාලයේදීය,
අහන්ගම.

---

ජී. බී. 14/46/7.

### 1952 අංක 6 දරන ප්‍රදේශාධිකාරි සභා (පොදු ආදශී අතුරු ව්‍යවස්ථා) ආඥාපනත

1952 අංක 6 දරන ප්‍රදේශාධිකාරි සභා (පොදු ආදශී අතුරු ව්‍යවස්ථා) ආඥාපනතේ 3 වැනි වගන්තිය යටතේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ තිස්සමහාරාම ගම් ප්‍රදේශයේ ගම්කායශී සභාව විසින් සම්මත කර ගන්නා ලද පහත දැක්වෙන යෝජනාව එකී වගන්තියේ ප්‍රකාර මෙහි පළ කරනු ලැබේ.



**යෝජනාව**

ප්‍රදේශ පාලන අමාත්‍යවරයා විසින් සම්පාදනය කරන ලද්දාවූ ද සෙනේට් මන්ත්‍රී මණ්ඩලයේ හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් අනුමත කරන ලද බව 1953නේ අගෝස්තු මස 7 වැනි දින අංක 10,560 දරන ගැසට් පත්‍රයේ පළ වූ නිවේදනයෙන් ප්‍රකාශ කරන ලද්දාවූද පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල 1 සිට 37 දක්වා වූ කාණ්ඩ මේ යෝජනාව ගැසට් පත්‍රයේ පළවන දින සිට සම්මත කර ගැනීමට හම්බන්තොට දිස්ත්‍රික්කයේ තිස්සමහාරාම ගම් ප්‍රදේශයේ ගම්කායශී සභාව විසින් 1952 අංක 6 දරන ප්‍රදේශාධිකාරි සභා (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) ආඥාපනතේ 3 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් යෝජනා කරනු ලැබේ.

ඊ. ඩී. සේනානායක,
තිස්සමහාරාම ගම් ප්‍රදේශයේ ගම්කායශී සභාවේ ප්‍රධානතුමා.

1958 දෙසැම්බර් මස 20 වැනිදා
තිස්සමහාරාම ගම්සභා කාර්යාලයේදීය.

---

## අතුරු ව්‍යවස්ථා

ඇල්ජීඩී. ජී ඊ. 14/38.

### ගම්සභා ආඥාපනත

ගම්සභා ආඥාපනතේ (198 පරිච්ඡේදයේ) 49 වැනි වගන්තිය යටතේ කොළඹ දිස්ත්‍රික්කයේ හෙනරත්ගොඩ ගම්කායශී සභාව විසින් සම්පාදිතව, 1947ක්වූ සැප්තැම්බර් මස 24 වැනි දින අංක 9,773 දරන ගැසට් අතිරේකයේ පළවූ ප්‍රකාශනයෙන් සංශෝධිත වූ එකී වගන්තියේ (3) වැනි උප වගන්තියෙන් පළාත් පාලන හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යතුමා කෙරෙහි පැවරී තිබෙන බලයේ ප්‍රකාර එතුමා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථා.

වී. සී. ජයසූරිය,
පළාත් පාලන හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථාවර ලේකම් තැන.

1958 දෙසැම්බර් මස 16 වැනි දින,
කොළඹ.

**රථවාහන හා සතුන් පිළිබඳ බද්ද සම්බන්ධයෙන් වූ අතුරු ව්‍යවස්ථා**

1. (1) ආඥාපනතේ 47 වැනි වගන්තිය යටතේ අය කරනු ලබන රථවාහන හා සතුන් පිළිබඳ බද්ද වෙනුවෙන් ඒ බද්දට යටත් වූ යම් රථවාහනයක් හෝ සතෙකු අයිතිව හෝ භාරව හෝ පාලනයෙහි තබා ගෙන සිටින්නාවූ සෑම අයෙකු විසින්ම සාමාන්‍යයෙන් මෙහි සඳහන් "ඒ" උපලේඛනයෙහි පෝර්මයේ ප්‍රකාර විස්තර උපලේඛනයක් ප්‍රධාන තුමාට යැවිය යුතුයි. මේ පෝර්ම ගම්කායෂී සභා කාර්යාලයෙන් ලබාගත හැක.

(2) ආඥාපනතේ 47 වැනි වගන්තිය යටතේ බද්ද ගෙවීමට බැඳී සිටින අය විසින් 1959 වැනි වර්ෂය වෙනුවෙන් (1) වැනි ඡේදයේ සඳහන් උපලේඛනය සම්පූර්ණ කොට 1959 ජනවාරි මස 31 වැනි දින හෝ එයට මත්තෙන් ප්‍රධාන තුමා වෙත යැවිය යුතුයි. එකී අය ඒ වාහනය හෝ සතා හෝ අයිතිය හෝ භාරය හෝ පාලනයෙහි තබා ගෙන සිටින්නාවූ ඊට පසු මොනම අවුරුද්දක් වෙනුවෙන් වත් එකී අයගෙන් එබඳු උපලේඛනයක් අවශ්‍ය නැත.

2. ආඥාපනතේ 47 (2) වැනි වගන්තියේ විධිවිධාන වලට යටත්ව (1) වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් උපලේඛනය සැපයුවාවූ සෑම අයෙක්ම තව දුරටත් දැනුම් දෙනු ලැබීමක් නැතිව—

(අ) උපලේඛනයේ සඳහන් රථවාහන හා සතුන් සඳහාවූ බද්ද 1959 අවුරුද්ද වෙනුවෙන් ඒ අවුරුද්දේ මාර්තු 31 වැනිදා එයට මත්තෙන් හෝ ගෙවීමට යටත් වෙති;

(ආ) ඊට පසු එක් එක් වර්ෂය වෙනුවෙන් ඒ උපලේඛනයේ සඳහන් කරන ලදුව, එකී වර්ෂයේ දවස් 30කට වැඩි කාල යක් තමාට අයිතිව හෝ තමාගේ භාරයේ හෝ තමාගේ පාලනය පිට හෝ තිබෙන්නාවූ එකී රථවාහන හා සතුන් සඳහාවූ බද්ද, එකී එක් එක් අවුරුද්දේ මාර්තු 31 වැනිදා හෝ ඊට මත්තෙන් හෝ ගෙවීමට යටත් වෙති.

3. 1 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් උපලේඛනය සැපයුවාට පසු යම් කිසිවෙකු විසින් ඒ උපලේඛනයේ සඳහන් නොකරන ලද්දාවූද ආඥාපනත යටතේ බද්දට යටත්වූද යම් රථවාහනයක් හෝ සතෙකු අත්පත් කරගෙන, තබාගෙන හෝ පාවිච්චියට ගෙන තිබේ නම් හෝ (1) වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ යම් උපලේඛනයක් සපයා නැත්තාවූ යම් කිසිවෙකු විසින් එකී බද්දට යටත් යම් රථවාහනයක් හෝ සතෙකු පළමුවන වරට අත්පත් කරගෙන, තබාගෙන හෝ පාවිච්චියට ගෙන තිබේ නම් එවිට ඒ අය විසින් එබඳු යම් රථවාහනයක් හෝ සතෙකු අත්පත් කර ගැනීමේ හෝ තබා ගැනීමේ නොහොත් පාවිච්චි කිරීමට පටන් ගැනීමේ දින සිට එක මාසයක් ඇතුළතදී සාමාන්‍යයෙන් මීට යාකොට ඇති "ඒ" උපලේඛනයේ සඳහන් පෝරමයේ ප්‍රකාරයට ලියවිල්ලකින්වූ දැන්වීමකින් එසේ අත්පත් කර ගත් බව ප්‍රධාන තුමාට දැනුම් දිය යුතුයි.

4. ආඥාපනතේ 47 (2) වැනි වගන්තියේ විධිවිධාන වලට යටත්ව (3) වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ලියවිල්ලකින්වූ ලේඛනය සැපයුවාවූ සෑම අයෙක්ම, එකී ලේඛනය සැපයූ අවුරුද්ද වෙනුවෙන් ද ඊට පසු සෑම අවුරුද්දක් වෙනුවෙන්ද එකී ලේඛනයේ සඳහන් කරනු ලැබ තමාට අයිතිව හෝ තමාගේ භාරයේ හෝ තමාගේ පාලනය පිට හෝ තිබෙන්නාවූ රථවාහන හා සතුන් සඳහාවූ බද්ද, ඒ සඳහා ප්‍රධාන තුමා විසින් තමාට දැනුම් දෙනු ලබන යම් කාල සීමාවක් ඇතුළත දී ගෙවීමට බැඳී සිටිති.

5. (1) 1 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් උපලෙඛනයේ හෝ (3) වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ලියවිල්ලකින් වූ ලේඛනය හෝ සැපයුවාට පසු ඒ උපලේඛනයට ඇතුළත් කළා වූ හෝ ලේඛනයේ සඳහන් කළාවූ හෝ යම් රථවාහනයක් හෝ සතෙකු සම්බන්ධයෙන් වූ බද්ද ගෙවීමට බැඳීමෙන් ආඥාපනතේ 47 (3) වැනි වගන්තිය යටතේ තමා නිදහස් කිරීමට අයිතිවාසිකම් කියා සිටින සෑම අයෙකු විසින්ම එසේ නිදහස් කිරීමට අයිතිවාසිකම් කියා සිටින්නේ අසවල් අසවල් හේතූන් නිසා යයි දැක්වෙන ලියවිල්ලකින්වූ දැන්වීමක් වහාම ප්‍රධාන තුමාට යැවිය යුතුයි.

(2) 1 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් උපලේඛනය හෝ (3) වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ලියවිල්ලකින් වූ ලේඛනය හෝ සැපයුවාට පසු ඒ රථවාහනය හෝ සතා තබා ගැනීම හෝ පාවිච්චි කිරීම නතර කළාවූ නොහොත් ඒ පිළිබඳ අයිතිවාසිකම් අත්හැරියාවූ සෑම අයෙකු විසින්ම ලියවිල්ලකින් වූ දැන්වීමකින් තමා ඒ සතා හෝ රථවාහනය තබා ගැනීම හෝ පාවිච්චි කිරීම නතර කළ බව නොහොත් ඒ ගැන අයිතිවාසිකම් අතහල බව වහාම ප්‍රධාන තුමා වෙත ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

6. යම් කිසිවෙකු විසින් බද්ද ගෙවූ විට ප්‍රධාන තුමා හෝ ඔහු විසින් ලියවිල්ලකින් බලය පවරනු ලැබූ යම් නිලධාරියෙකු විසින් ඒ බද්ද ගෙවූ රථවාහන වෙනුවෙන් ඒ අයට මෙහි පහත සඳහන් කොට ඇති "බී" උපලේඛනයෙහි දැක්වෙන පරිදි ඒ ඒ රථවාහනය සඳහා වෙන් වෙන් වශයෙන් යොදා ඇති විශෙෂ අකුරුද තහඩුව නිකුත් කරන අවුරුද්ද දැක්වෙන ඉලක්කම්ද රථවාහන රෙජිස්ටරයේ ඒ ඒ රථවාහන තහඩු පිළිබඳ වූ අංකයද සටහන් කොට ඇති තහඩුවක් නිකුත් කළ යුතුයි. එබඳු යම් තහඩුවක් පාවිච්චිය නිසා හෝ වෙනයම් ලෙසකින් හෝ නොපැහැදිලිව නොහොත් මැකී ගොස් තිබෙනොත් ඒ තහඩුව අයිතිකාරයා විසින් එය ප්‍රධාන තුමාට ආපසු භාර දිය යුතුයි. තවද ඔහු විසින් ශත පණහක් ගෙවූ විට ඔහුට අළුත් තහඩුවක් නැවත ලබා ගැනීමට අයිතිවාසිකම් තිබේ. එබඳු යම් තහඩුවක් නැතිවී හෝ සොරා ගෙන තිබෙන බැව් දිවුරුම් සහතිකයකින් හෝ වෙනයම් ලෙසකින් ප්‍රධාන තුමාට ඒත්තු ගැනීමට සැලැස්සුවහොත් එතුමා විසින් අයිතිකාරයාගේ ඉල්ලීම පිටත් ඔහු විසින් ශත හැටක් ගෙවනු ලැබූ විටත් අළුත් තහඩුවක් නිකුත් කළ හැකියි.

7. සෑම රථවාහනයකම අයිතිකරු විසින් හෝ භාරකරු විසින් 6 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ ඒ රථවාහනය වෙනුවෙන් නිකුත් කරන ලද තහඩුව, ඒ රථවාහනයේ කාටත් පෙණෙන තැනක සවි කළ යුතුයි.

8. ප්‍රධානතුමා විසින් හෝ ආදායම් නිලධාරි තැන හෝ ප්‍රධාන තුමාගේ ලියවිල්ලකින් බලය ලත් ඕනෑම නිලධාරියෙකු විසින් හෝ ඕනෑම මාවතක හෝ පාරක ගමනාගමනයෙහි යෙදී තිබෙන රථවාහනයක් ඒ රථවාහනයෙහි (7) වැනි අතුරු ව්‍යවස්ථාවෙහි ප්‍රකාර සවිකොට තිබිය යුතු තහඩුව පරීක්ෂා කර බැලීම පිණිස නවත්වා නතර කිරීම නීත්‍යානුකූල වන්නේය. තවද ප්‍රධාන තුමා විසින් හෝ එකී නිලධාරියා විසින් හෝ ඉල්ලීමක් කර සිටින කල්හි එකී ඕනෑම රථයක භාරකාරයා විසින් හෝ ඒ රථය පදවන්නා විසින් හෝ රථය නවත්වා ප්‍රධාන තුමාට හෝ එකී නිලධාරියාට එකී තහඩුව පරීක්ෂා කර බැලීමට ඉඩ දිය යුතුයි.

9. කාර්ය සභාව විසින් සම්පාදිතව, 1941කේ සැප්තැම්බර් මස 26 වැනි දින අංක 8,796 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද රථවාහන හා සතුන් පිළිබඳ බද්ද සම්බන්ධයෙන් වූ අතුරු ව්‍යවස්ථා මෙයින් අවලංගු කරනු ලැබේ.

10. මේ අතුරු ව්‍යවස්ථාවල—

"ප්‍රධාන තුමා" යනුවෙන් කාර්ය සභාවේ ප්‍රධාන තුමා අදහස් කරනු ලැබේ;

"කාර්ය සභාව" යනුවෙන් කොළඹ දිස්ත්‍රික්කයේ හෙනරත්ගොඩ ගම්කායෂී සභාව අදහස් කරනු ලැබේ;

"ආඥාපනත" යනුවෙන් ගම්සභා ආඥාපනත (198 වැනි පරිච්ඡේදය) අදහස් කරනු ලැබේ.

## "ඒ" උපලේඛනය

### පෝරමය

අංකය :————.

කොඨාශයේ අංකය :————.

**කොළඹ දිස්ත්‍රික්කයේ හෙනරත්ගොඩ ගම්කායෂී සභාව**

රථවාහන හා සතුන් පිළිබඳ බද්ද සම්බන්ධයෙන් වූ අතුරු ව්‍යවස්ථා වල ප්‍රකාරයට සැපයිය යුතු රථවාහන හා*/හෝ සතුන් පිළිබඳ ලේඛනයයි.

අයිතිකාරයාගේ නාම :————.

ගම :————.

හැඳුල් :————.

| රථවාහන හා*/හෝ සතුන් පිළිබඳ විස්තරය | ගණන වචන වලින් | වෙනත් විස්තර |
|---|---|---|
| කරත්ත, තිරික්කල හෝ ජින් රික්ෂෝ රථ හැර වෙනත් ඕනෑම අන්දමක වාහන ... | | |
| ඕනෑම අන්දමක ගොන් දෙන්නා බඳින බරකරත්ත හෝ තිරික්කල ... | | |
| තනි ගොනා බඳින බරබාග කරත්ත හෝ තිරික්කල | | |
| අත් කරත්ත ... | | |
| ජින් රික්ෂෝ රථ ... | | |
| බයිසිකල් (වෙනත් විස්තර සඳහා සපයා ඇති තීරුවේ සාදන ලද අයගේ අංකය සඳහන් කරනු) | | |
| අලි ... | | |
| අශ්වයෝ ... | | |
| අශ්වතරයෝ ... | | |
| බූරුවෝ ... | | |

මෙහි ඉහත සඳහන් විස්තර සෑම අතින්ම සත්‍ය බවත් නිවැරදි බවත් මම මෙයින් ප්‍රකාශ කරමි.

දිනය :————. අයිතිකාරයාගේ අත්සන :————.

* අනවශ්‍ය වචන කපා හරිනු.

## " බී " උපලේඛනය

පෝරමය

| | |
|---|---|
| බර කරත්තයක්, තිරික්කලයක් හෝ ජින් රික්ෂෝ රථයක් හැර වෙනත් ඕනෑම අන්දමක වාහනයක් සඳහා ... ... ... | හෙ. ග. ස. වා. |
| ඕනෑම අන්දමක බර කරත්තයක් (ගොන් දෙන්නා බඳින) හෝ තිරික්කලයක් සඳහා ... | හෙ. ග. ස. බ. ක. |
| සෑම බර බාග කරත්තයක් තනි ගොනා බඳින හෝ තිරික්කලයක් සඳහා ... ... | හෙ. ග. ස. බ. බා. |
| සෑම ජින් රික්ෂෝ රථයක් සඳහා ... ... | හෙ. ග. ස. රි. |
| සෑම අත් කරත්තයක් සඳහා ... ... | හෙ. ග. ස. අ. ක. |
| සෑම බයිසිකලයක් සඳහා ... ... | හෙ. ග. ස. බ. |

---

ඇල්. ඩී.—බී. 14/48.
ඇල්. ජී. ඩී.— ජීඅයි 11/6 ඒ.

## ගම්සභා ආඥාපනත

ගම්සභා ආඥාපනතේ (198 පරිච්ඡේදයේ) 49 වැනි වගන්තිය යටතේ මහනුවර දිස්ත්‍රික්කයේ ගඟවට කෝරළය ගම් ප්‍රදේශයේ ගම්කායයි සභාව විසින් සම්පාදිතව, 1947ක් වූ සැප්තැම්බර් මස 24 වැනි දින අංක 9,773 දරන ගැසට් අතිරේකයේ පළවූ ප්‍රකාශනයෙන් සංශෝධිත වූ එකී වගන්තියෙන් පළාත් පාලන සහ සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යතුමා කෙරෙහි පැවරී තිබෙන බලයේ ප්‍රකාර එතුමා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථා.

වී. සී. ජයසූරිය,
පළාත් පාලන හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍ය කාර්යාංශයේ ස්ථාවර ලේකම් තැන.

1958 දෙසැම්බර් 16 වැනි දින
කොළඹදීය.

### අප්‍රසන්න වූ හා අන්තරායදායක වූ කර්මාන්ත සම්බන්ධයෙන් වූ අතුරු ව්‍යවස්ථා

1. පහත දැක්වෙන කර්මාන්ත අන්තරායදායක වූ කර්මාන්ත වශයෙන් සලකනු ලැබේ :—

(1) පිදුරු ගබඩා කිරීම,
(2) වළක් කැනීමෙන් හුණුගල් ලබා ගැනීම,
(3) කපු පුළුන්, නූල් ආදිය ගබඩා කිරීම,
(4) ලී මඩුවක් තබා ගැනීම,
(5) දර මඩුවක් තබා ගැනීම,
(6) භූමිතෙල් ගබඩාවක් තබා ගැනීම,
(7) ස්වර්ණාභරණ සෑදීම,
(8) කම්මලක් තබා ගැනීම,
(9) මුද්‍රණ යන්ත්‍රාලයක් තබා ගැනීම,
(10) තේ කර්මාන්ත ශාලාවක් තබා ගැනීම,
(11) අම්ලකර වායුව පාවිච්චි කරන කම්හලක් තබා ගැනීම,
(12) හාල් මෝලක් තබා ගැනීම.

2. පහත දැක්වෙන කර්මාන්ත අප්‍රසන්න කර්මාන්ත වශයෙන් සලකනු ලැබේ :—

(1) කුකුළු තාරාදී පක්ෂීන් විකිණීම පිණිස ස්ථානයක් තබා ගැනීම,
(2) ජාඩි හෝ කරවල ගබඩා කිරීම,
(3) තොග ගණනේ විකිණීම පිණිස නරක්වන සුළු ආහාර ද්‍රව්‍ය ගබඩා කිරීම,
(4) කොම්පෝස්ට් පෝර හෝ කෘත්‍රිම පෝර සෑදීම්,
(5) සබන් සෑදීම,
(6) හම් පදම් කිරීමේ ස්ථානයක් තබා ගැනීම,
(7) සතුන්ගේ හම් ගබඩා කිරීම,
(8) සතුන්ගේ ඇට කටු ගබඩා කිරීම,
(9) රබර් ෂීට්, ක්‍රේප් රබර් දුම් ගැස්වීම හෝ සෑදීම,
(10) කෘත්‍රිම පෝර හෝ කෘත්‍රිම පෝර සෑදීමට ගන්නා ද්‍රව්‍ය ගෝනි තුනකට වඩා ගබඩා කිරීම,
(11) කෝඩා සෑදීම,
(12) දුම්කොළ වියළා සකස් කිරීම,
(13) සුරුට්ටු කර්මාන්තය,
(14) පැණි හකුරු කර්මාන්තය,
(15) බීඩි කර්මාන්තය,
(16) රා එකතු කිරීමේ ස්ථානයක් තබා ගැනීම,
(17) විනාකිරි සෑදීම.

3. පහත දැක්වෙන කර්මාන්ත අන්තරායදායක වූ හෝ අප්‍රසන්න වූ කර්මාන්ත වශයෙන් සලකනු ලැබේ :—

(1) කෙඳි සායම් කිරීම,
(2) ගඩොල් හා උළු පිළිස්සීම,
(3) බැටරි චාජ් කිරීම,
(4) හුණුගල් පිච්චීම, ගබඩා කිරීම, සකස් කිරීම හෝ කැබලි කිරීම.

ජී. බී. 14/36/9.

## ගම්සභා ආඥාපනත

ගම්සභා ආඥාපනතේ (198 පරිච්ඡේදයේ) 49 වැනි වගන්තිය යටතේ මාතර දිස්ත්‍රික්කයේ කැකනදුර ගම් ප්‍රදේශයේ ගම්කායයි සභාව විසින් සම්පාදිතව, 1947ක් වූ සැප්තැම්බර් මස 24 වැනි දින අංක 9,773 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ වූ ප්‍රකාශනයෙන් සංශෝධිත වූ එකී වගන්තියේ (3) වැනි උප වගන්තියෙන් පළාත් පාලනය හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යතුමා කෙරෙහි පැවරී තිබෙන බලයේ ප්‍රකාර එතුමා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථාව.

වී. සී. ජයසූරිය,
පළාත් පාලන හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍ය කාර්යාංශයේ ස්ථාවර ලේකම් තැන.

වර්ෂ 1958ක් වූ දෙසැම්බර් 15 වැනි දින,
කොළඹදීය.

### අතුරු ව්‍යවස්ථාව

කැකණදුර ගම් කායයි සභාව විසින් සම්මත කර ගන්නා ලද ආහාර ද්‍රව්‍ය විකිණීම පිළිබඳ පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල, එහි 1, 2 හා 3 වැනි අතුරු ව්‍යවස්ථාවල " මස් " යන වචනය ඒ ඒ එක් අතුරු ව්‍යවස්ථාවේ කොතැනක යෙදුණත් ඒ වෙනුවට " මස්, හාල් හා කුළු බඩු " යන වචන යෙදීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

---

ඇල්. ජී. ඩී—ජීසී. 14/11.

## ගම්සභා ආඥාපනත

ගම්සභා ආඥාපනතේ (198 පරිච්ඡේදයේ) 49 වැනි වගන්තිය යටතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ පිලැස්ස ගම් ප්‍රදේශයේ ගම්කායයි සභාව විසින් සම්පාදිතව, 1947ක් වූ සැප්තැම්බර් මස 24 වැනි දින අංක 9,773 දරන ගැසට් අතිරේකයේ පළ වූ ප්‍රකාශනයෙන් සංශෝධිත වූ එකී වගන්තියෙන් පළාත් පාලනය සහ සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යතුමා කෙරෙහි පැවරී තිබෙන බලයේ ප්‍රකාර එතුමා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථාව.

වී. සී. ජයසූරිය,
පළාත් පාලන හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍ය කාර්යාංශයේ ස්ථාවර ලේකම් තැන.

වර්ෂ 1958 දෙසැම්බර් මස 17 දින,
කොළඹදීය.

### අතුරු ව්‍යවස්ථාව

1. පහත දැක්වෙන කර්මාන්ත අප්‍රසන්නවූ කර්මාන්ත වශයෙන් සලකනු ලැබේ :—

(1) ජාඩි හෝ කරවල ගබඩා කිරීම,
(2) තොග ගණනේ විකිණීම පිණිස නරක් විය හැකි ආහාර ද්‍රව්‍ය හා සිල්ලර බඩු ගබඩා කිරීම,
(3) කොපෝස්ට් නොහොත් කෘත්‍රිම පොහොර සෑදීම,
(4) විනාකිරි සෑදීම,
(5) සබන් සෑදීම,
(6) දුම්කොළ වියළා සකස් කිරීම,
(7) හම් පදම් කරන ස්ථානයක් තබා ගැනීම,
(8) සතුන්ගේ ලේ හෝ මළකුණු හෝ උණු කිරීම,
(9) පුවක් වියළා සකස් කිරීම,
(10) සතුන්ගේ හම් හෝ ඇට කටු හෝ ගබඩා කිරීම,
(11) රබර් ෂීට් හෝ ක්‍රේප් රබර් දුම් ගැස්සීම හා සෑදීම,
(12) කෘත්‍රිම පොහොර හෝ කෘත්‍රිම පොහොර සෑදීමට ගන්නා ද්‍රව්‍ය ගෝනි තුනකට වඩා ගබඩා කිරීම,
(13) කෝඩා සෑදීම,
(14) ලැලි පොඟවා සකස් කිරීම,
(15) මාළු අසිස් දැමීම,
(16) රා එකතු කරන ස්ථානයක් තබා ගැනීම,
(17) පැණි හෝ හකුරු සෑදීම,
(18) රබර් වියළීම හෝ සෑදීම,
(19) යන්ත්‍ර සූත්‍ර මාර්ගයෙන් මිරිස් හා තුනපහ ඇඹරීම,
(20) සුරුට්ටු සෑදීම,
(21) බීඩි සෑදීම,
(22) මිණිපෙට්ටි සෑදීම,
(23) රබර් ගබඩා කිරීම.

2. පහත සඳහන් කර්මාන්ත අන්තරායදායක කර්මාන්ත වශයෙන් සලකනු ලැබේ :—

(1) මෝටර් රථ වාහන අලුත්වැඩියා කරන ස්ථානයක් තබා ගැනීම,
(2) කොප්පරා සෑදීම,
(3) තෙල් වලින් හෝ වාෂ්ප බලයෙන් හෝ පැට්‍රල් ආදි දැවෙන ද්‍රව්‍ය වලින් හෝ ඉලෙක්ට්‍රික් බලයෙන් හෝ ක්‍රියා කරන යන්ත්‍ර පාවිච්චි කරන යම් කර්මාන්තයක්,
(4) කබුක්ගල්, බොරලු, කළුගල්, ලබාගැනීමට වළවල් කැනීම හෝ වළවල් තබාගැනීම,
(5) මිණිරන් වියලීම හෝ ගබඩා කිරීම,
(6) වළක් කැනීමෙන් හුණුගල් ලබා ගැනීම,
(7) හාල් හෝ වී මෝලක් තබා ගැනීම,
(8) යන්ත්‍ර සූත්‍ර ආදියෙන් පොල් තෙල් සිඳීම,
(9) සෙක්කුවකින් පොල් තෙල් සිඳීම,
(10) දර හෝ ලී මඩුවක් තබා ගැනීම,
(11) කෙඳි වර්ග තෙලීම හෝ ගබඩා කිරීම,
(12) භූමිතෙල් ගබඩාවක් තබා ගැනීම,
(13) කපු පුළුන්, නූල් හෝ පිදුරු ගබඩා කිරීම,
(14) මුද්‍රණාලයක් තබා ගැනීම,
(15) කපාපු පොල් සකස් කිරීම,
(16) සවර්ණාභරණ සෑදීම,
(17) අම්ලකර වායුව පාවිච්චි කරන ලෝකුරු වැඩ කිරීම.
(18) කොප්පරා ගබඩා කිරීම,
(19) ගිණිකූරු සෑදීම,
(20) පොල් කටු අඟුරු ගබඩා කිරීම,
(21) කම්හලක් තබා ගැනීම,
(22) ගෘහ භාණ්ඩ සෑදීම,
(23) වඩු කර්මාන්ත ශාලාවක් තබා ගැනීම,
(24) බයිසිකල් අළුත්වැඩියා කරන ස්ථානයක් තබා ගැනීම.

3. පහත දැක්වෙන කර්මාන්ත අප්‍රිය හා අන්තරාදායක කර්මාන්ත වශයෙන් සලකනු ලැබේ:—

(1) කෙඳි වර්ග සායම් කිරීම,
(2) ගඩොල් හෝ උළු පිච්චීම,
(3) බැටරි චාජ් කිරීම,
(4) හුණුගල් පිච්චීම, ගබඩා කිරීම, සකස් කිරීම හෝ කැබලි කිරීම,
(5) අඟුරු සඳහා පොල් කටු පිළිස්සීම.

# විවිධ දැන්වීම්

## අම්බලන්ගොඩ නගර සභාව

### 1959 වර්ෂයේ වරිපනම් ලේඛනය

1939 අංක 61 දරන නගර සභා ආඥාපනතේ 179 වැනි ඡේදයෙන් කියවෙන පරිදි 1947 අංක 29 දරන නාගරික සභා ආඥාපනතේ 235 (1) වැනි ඡේදය යටතේ මෙම නගරයේ 1959 වැනි වර්ෂයේ වරිපනම් ලේඛනය කාර්යාලීය වේලාවන්හිදී නගර සභා කාර්යාලයේ දී පරීක්ෂා කිරීම සඳහා විවෘතව ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සෑම් රණසූරිය,
අම්බලන්ගොඩ නගර සභාවේ සභාපති.

නගර සභා කාර්යාලය,
අම්බලන්ගොඩ, 1958. 12. 23.

---

## අටුළුගම් කෝරළේ ගම්කායිසභාව—දෙහිඕවිට

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත දැක්වෙන උපලේඛනයෙහි සඳහන් අය විසින් මස් පිණිස සතුන් මරා මස් විකිණීම පිණිස 1959 වර්ෂයට බලපත්‍ර ඉල්ලුම් කර තිබෙන බවත්, මෙම බලපත්‍ර නිකුත් කිරීමට විරුද්ධව අටුළුගම් කෝරළේ ගම්කායිසභා ප්‍රදේශය ඇතුළත පදිංචි ඕනෑම කෙනෙකුට තමා ඒ සඳහා විරුද්ධ වන්නේ අසවල් කරුණු සඳහා යයි දැක්වෙන ලියවිල්ලක් පිටපත් දෙකක් සිටින සේ මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළ වන දින සිට 14 දිනක් ඇතුළත මා වෙත ලියා එවීමට බලය තිබෙන බවත්, මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ 201 වෙනි පරිච්ඡේදයේ අංක 7 දරන 1947 අංක 44 දරන ආඥාපනතින් සංශෝධිත වූ අංක 6 දරන ආඥාපනත යටතේ මෙයින් දැනුම් දෙමි.

මා. ග. ජයවර්ධන.
අටුළුගම් කෝරළේ ගම්කායිසභාවේ
ප්‍රධාන තැන.

ගම්කායිසභා කාර්යාලය,
දෙහිඕවිට,
1958. 12. 19 දින දීය.

### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම | ස්ථානය සහ වෙළඳාම |
| --- | --- |
| 1. පී. ඇස්. ඒ. රහීම්, අංක 62, දෙහිඕවිට | අංක 141, දෙහිඕවිට ; "හරක් මස්" |
| 2. පී. ඇස්. ඒ. රහීම්, අංක 62, දෙහිඕවිට | අංක 143, දෙහිඕවිට ; "හරක් මස්" |
| 3. ඒ. අබ්දුල් සලාම්, අංක 62, දෙහිඕවිට | අංක 139, දෙහිඕවිට ; "එළු මස්" |

## විශේෂ නිවේදනයයි

1959 ජනවාරි 14 වැනි බදාදා ආණ්ඩුවේ නිවාඩු දිනයක් වන බැවින්, 1959 ජනවාරි 16 වැනි දින නිකුත්කරනු ලබන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා එවන සියළුම දැන්වීම් සහ නිවේදන, 1959 ජනවාරි 12 වැනි සඳුදා පස්වරු 4 ට ප්‍රථම ආණ්ඩුවේ මුද්‍රණාලයට ලැබෙන්ට සැලැස්විය යුතු බව කාගේත් දැනගැනීම සඳහා මෙයින් නිවේදනය කරමි.

1958 දෙසැම්බර් 27 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය,
කොළඹ.

බර්නාඩ් ද සිල්වා,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

**දැන්වීම් සහ ප්‍රකාශණයන් සඳහා 1955 ජනවාරි 1 වැනි දින සිට අයකරනු ලබන සංශොධිත ගාස්තු**

# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

(සෑම සිකුරාදා දිනයන්හි පළ කරනු ලැබේ)

1. **සියළුම දැන්වීම් සහ ප්‍රකාශණයන් පළ කරණු ලබන්නේ ප්‍රසිඬ කරන්නාගේ වගකීම පිටය.**

2. පෞද්ගලික පළ කරන්නන්ගේ සියළුම දැන්වීම් සහ ප්‍රකාශණ, ඒ සඳහා නියමිත සම්පූර්ණ **ගාස්තුවත් සමග කොළඹ රජයේ මුද්‍රණාලයාධිපති** තැනට තැපැලෙන් එවීමට හෝ ගෙනැවිත් භාර දීමට හෝ පුළුවන.

3. සතියේ දවස්වල පෙරවරු 9 සිට පස්වරු 4.30 දක්වා ද සෙනසුරාදා දවස්වල පෙරවරු 9 සිට පස්වරු 1 දක්වාද කාර්යාලයේ කටයුතු කරන කාලය බව සැලකිය යුතුය.

4. සතියේ දවස්වල පස්වරු 3.30ට සහ සෙනසුරාදා දවල් 12ට මුදල් ගණුදෙනු කාලය අවසන් වේ.

5. **සියළුම දැන්වීම් සහ ප්‍රකාශණ සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි.** තැපැලෙන් දැන්වීම් සහ ප්‍රකාශණයන් එවන විට, ඒ සමගම අයවිය යුතු ගාස්තුව සඳහා මනි ඕඩරයක්, පෝස්ටල් ඕඩරයක් හෝ චෙක් පතක් රජයේ මුද්‍රණාලයාධිපති නාමට එවිය යුතුයි.

6. ප්‍රමාදය සහ දෙස් වලක්වා ගැනීම සඳහා, පළ කරන්ට නියමිත පිටපත **කඩදාසියේ එක් පැත්තක පැහැදිලිව ලියා එවිය යුතුයි.** ටයිප් ගසා එවනවා නම් වඩාත් හොඳයි.

7. **සෑම අත්සනකටම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතුයි.**

8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හෝ නමක් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් හෝ පළ කරනු නොලැබේ.

9. උසාවියේ අණ පණත් යටතේ නිකුත් කළායයි හැඟෙන ප්‍රකාශණ, **සුප්‍රීම් උසාවියේ** පෙරකදෝරු මහතකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිඬ කරනු නො ලැබේ.

10. දැන්වීම් සහ ප්‍රකාශණයන් සඳහා **1955 ජනවාරි 1 වැනි දින** සිට අය කරන ගාස්තු මෙසේයි :—

| | | රු. | ශ. |
|---|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව | ... ... ... | 10 | 0 |
| වැඩිවන සෑම අඟලට හෝ ඉන් කොටසකට | ... ... | 5 | 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට | ... ... | 60 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට | ... ... | 120 | 0 |

අඟලේ සෑම කොටසකටම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.

11. **සෑම සිකුරාදා දිනයකම ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.** ප්‍රසිඬ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

12. ගැසට් පත්‍රය පළ කරන දින සිට කාර්‍යාලය වැඩ කරන දින තුනකට ප්‍රථම **පස්වරු 4ට සියළුම දැන්වීම් සහ ප්‍රකාශණයන් කොළඹ රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි (සාමාන්‍ය වශයෙන් අඟහරුවාදා පස්වරු 4ට ප්‍රථමයෙන්).**

13. **ගැසට් පත්‍රය සඳහා දායක මුදල් වසකට හෝ ඉන් අඩකට කොළඹ රජයේ ප්‍රකාශන කාර්‍යාංශයේ අධිකාරි තැන විසින් කලින් භාරගනු ලැබේ.**

14. දායක මුදල් :—

| | | රු. | ශ. |
|---|---|---|---|
| වාර්ෂික දායක මුදල ... ... | එක් කාණ්ඩයක් සඳහා ... | 15 | 0 |
| | I වෙනි කාණ්ඩයේ එක් කොටසකට ... | 7 | 0 |
| සෑම කාණ්ඩයකම එක් කොටසක පිටපතකට | ... ... | | 25 |
| | තැපැල් ගාස්තුවත් සමග ... | | 31 |
| I වෙනි කාණ්ඩයේ එක් කොටසකට ... | ... ... | | 10 |
| | තැපැල් ගාස්තුවත් සමග ... | | 14 |

15. පරණ ගැසට් කොපි තිබේනම් ඒ සඳහා ගාස්තුව දෙගුණයක් වේ. මෙය **කොළඹ රජයේ ප්‍රකාශන කාර්‍යාංශයේ අධිකාරි තැනගෙන්** ඉල්ලුම් කළ යුතුයි.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.